# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

ලේකම්අංශය
14වනමහල
දේශීයආදායම්ගොඩනැගිල්ල
ශ්‍රීමත්චිත්තම්පලම්ඒගාඩිනර්මාවත
තැ.පෙ. 515, කොළඹ2- ශ්‍රීලංකාව

செயலகம்
14 வதுமாடி
உள்நாட்டுஇறைவரிக்கட்டிடம்
சேர்சிற்றம்பலம்ஏகாடினர்மாவத்தை
த.பெ.இல. 515,கொழும்பு -2,இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 – 2338570/ 2338574/ 2338543/ 2338635/ 2338659
දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 20135411 2135412 / 2135413
E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


**චක්‍රලේඛ අංක: SEC/2020/04** **2020 මැයි 19**

## රඳවා ගැනීමේ අනුයෝජිතයන් වෙත කෙරෙන නිවේදනයයි

## රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම

ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදු වලින් ලද දිනුම් ලෙස ගෙවන යම් මුදල් ප්‍රමාණයක්, ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය විසින් පවත්වනු ලබන යම් වෙන්දේසියකදී විකුණනු ලබන යම් මැණිකක් සඳහා එම මැණිකෙහි විකිණුම්කරු වෙත ගෙවිය යුතු විකිණුම් මුදල, යම් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හැර වෙනත් යම් තැනැත්තෙකු විසින් ගෙවනු ලබන පොලී සහ වට්ටම්, ලාභාංශ, ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලී, රාජ්‍යභාග, වාරික මුදලක්, විශ්‍රාම ගෙවීමක් හෝ වෙනත් ඕනෑම ගෙවීමක් මත **රඳවා ගැනීමේ බද්ද** හෝ **අත්තිකාරම් ආදායම් බද්ද** අඩු කිරීම සඳහා, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් වලට සමගාමීව දේශීය ආදායම් කෙමසාරිස් ජනරාල් විසින් 2020.04.06 දින යොමු අංක PN/IT/2020 - 03 (Revised) යටතේ පළ කරන ලද ඔහුගේ නිවේදනය මඟින්, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට සිදු කරනු ලබන සංශෝධන සඳහා පාර්ලිමේන්තු අනුමැතියට යටත්ව, දැනටමත් දන්වා ඇති සංශෝධන අදාළ කර ගැනීමේදී පහසුකම් සැලසීම පිණිස රඳවා ගැනීමේ අනුයෝජිතයන්ට අවශ්‍ය විස්තර සටහන් සහ උපදෙස් මෙම චක්‍රලේඛයෙහි දැක්වේ.

මෙම චක්‍රලේඛය 2020 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

### අ. රඳවා ගැනීමේ බද්දට යටත් ගෙවීම් ලබන තැනැත්තන්

i. නිර්වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන නිදහස් මුදල් ප්‍රමාණ හැර ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් සහිත ඉහත දක්වා ඇති ඕනෑම ගෙවීමක් මත රඳවා ගැනීමේ බද්ද අඩු කළ යුතුය.

ii. **ඕනෑම තැනැත්තෙකුට** (වාසික හෝ නිර්වාසික) ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදු වලින් ලද දිනුම් ලෙස ගෙවන යම් මුදල් ප්‍රමාණයක් හෝ ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය විසින් පවත්වනු ලබන යම් වෙන්දේසියකදී විකුණනු ලබන යම් මැණිකක් සඳහා එම මැණිකෙහි විකිණුම්කරු වෙත ගෙවිය යුතු විකිණුම් මුදල රඳවා ගැනීමේ බද්ද අඩු කිරීමට යටත් වේ.

### 1. ගෙවීම් වර්ග සහ රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණ

i. ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම් හෝ සූදු වලින් ලද දිනුම් ලෙස ගෙවන යම් මුදල් ප්‍රමාණයක් 14% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්දට යටත් වේ. කෙසේ වෙතත්, දළ මුදල් ප්‍රමාණය රු.

500,000 නොඉක්මවන, ලොතරැයියකින් හිමි වන යම් මුදල් ප්‍රමාණයක් රඳවා ගැනීමේ බද්දට යටත් නොවේ.

ii. ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය විසින් පවත්වනු ලබන යම් වෙන්දේසියකදී විකුණනු ලබන යම් මැණිකක් සඳහා එම මැණිකෙහි විකිණුම්කරු වෙත ගෙවිය යුතු විකිණුම් මුදල 2.5% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්දට යටත් වේ.

iii. වාසික තැනැත්තෙකු විසින් නිර්වාසික තැනැත්තෙකුට ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලී, රාජ්‍යභාග, වාරික මුදලක්, විශ්‍රාම ගෙවීමක් සහ වෙනත් සමාන ගෙවීමක් (නිදහස් ප්‍රමණ හැර) ලෙස ගෙවූ හෝ ගෙවිය යුතු, ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් සහිත ඕනෑම මුදල් ප්‍රමාණයක් 14% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්දට යටත් වේ.

iv. යම් නිර්වාසික තැනැත්තෙකුට, පොලී ( නිදහස් පොලී හැර), වට්ටම් ලෙස ගෙවිය යුතු ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් සහිත ඕනෑම මුදල් ප්‍රමාණයක් 5% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්දට යටත් වේ.

v. වාසික තැනැත්තෙකු විසින් නිර්වාසික තැනැත්තෙකුට 85 (2) වන වගන්තිය සහ 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/51 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ ගොඩබිම්, මුහුදු, ගුවන් ප්‍රවාහන හෝ විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් ගෙවනු ලබන මුදල් ප්‍රමාණයක්, අදාළ ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුමේ විධිවිධාන වලට යටත්ව 2% ක අනුප්‍රමාණයට රඳවා ගැනීමේ බද්දට යටත් වේ.

## 2. ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුම්වල විධිවිධාන අදාළ කර ගැනීම

ශ්‍රී ලංකාව සහ නිර්වාසික තැනැත්තාගේ වාසික රට සමඟ පවතින ද්විත්ව බදු වැලැක්වීමේ ගිවිසුම්වල විධිවිධාන වලට යටත්ව, වඩා අඩු රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණය (ඉහත අයිතම 1 හි සඳහන් අනුප්‍රමාණයට සාපේක්ෂව) එම ගෙවීම් මත අදාළ කර ගත යුතුය. නිර්වාසික තැනැත්තන්ට ගෙවීම් කිරීමේදී එම ගෙවීම සිදු කරන තැනැත්තා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් බදු නිශ්කාෂණ සහතිකයක් ලබා ගත යුතු අතර එම නිශ්කාෂණ සහතිකය නිකුත් කිරීමේදී වඩා අඩු අනුප්‍රමාණය (අදාළ වේ නම්) සලකා බලනු ලැබේ.

## 3. රඳවා ගැනීමේ බදු අඩු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

i. ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද (ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත) හැර දළ මුදල් ප්‍රමාණය, රඳවා ගැනීමේ බද්ද අඩු කිරීම සඳහා සලකනු ලබන මුදල් ප්‍රමාණය වේ.

ii. **යම් තැනැත්තෙකුට,** ඉන්වොයිසියේ සඳහන් මුළු වටිනාකම නිර්වාසික **තැනැත්තා වෙත** ප්‍රේෂණය කිරීමට අවශ්‍ය නම්, ඉන්වොයිසියේ වටිනාකම, ශුද්ධ වටිනාකම ලෙස සැලකිය යුතු අතර දළ වටිනාකම මත පදනම්ව අදාළ රඳවා ගැනීමේ බද්ද ගණනය කළ යුතුය.

iii. විදේශ ව්‍යවහාර වටිනාකම, රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමේදී අදාළ තැනැත්තා විසින් ප්‍රේෂණය සිදුකරනු ලබන දිනයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇති විනිමය අනුපාත (විකුණුම් අනුපාතය) යොදා ගත යුතුය.

iv. ආයොජනය, ප්‍රකාශ කරනු ලබන තැනැත්තා සහ වෙනත් තැනැත්තෙකුට ඒකාබද්ධව අයත් වේ නම්, අදාළ ගෙවීම ඒකාබද්ධ අයිතිකරුවන් අතර ආයෝජනයට ඔවුන් ආයෝජනය සම්බන්ධයෙන් දරනු ලබන ස්වකීය සම්බන්ධතා වලට ක්‍රමානුකූලව බෙදිය යුතුය. ඒකාබද්ධ අයිතිකරුවන්ගේ කැමැත්ත නිශ්චය කළ නොහැකි නම් එය සමාන ලෙස සැලකිය යුතුය.

## 4. නිදහස් ආදායම

i. ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කර ඇති යම් ණය මුදලක් මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු විසින් උපයන හෝ උපචිත වන පොලිය

ii. වාසික සමාගමක් විසින් එම වාසික සමාගමට හෝ වෙනත් වාසික සමාගමකට උපචිත වූ ලාභාංශ වලින් සාමාජිකයන් වෙත ගෙවන ලද ලාභාංශ

iii. වාසික සමාගමක් විසින් එම වාසික සමාගමට හෝ වෙනත් වාසික සමාගමකට උපචිත වූ, 84 වන වගන්තිය යටතේ රඳවා ගැනීමේ බද්දට යටත් වූ ලාභාංශ වලින් සාමාජිකයන් වෙත ගෙවන ලද ලාභාංශ

iv. නිර්වාසික තැනැත්තෙකු වන සාමාජිකයෙකුට වාසික සමාගමක් විසින් ගෙවූ ලාභාංශ

v. 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය සමග ඇති කර ගත් ගිවිසුමකට අතුළත් වූ සහ 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධානයන්ට අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාර කිහිපයක නිරත වන යම් වාසික සමාගමක් විසින් ගෙවූ ලාභාංශ:-

අ. ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රති අපනයනය සම්බන්ධ වෙළදාම;

ආ. එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටක දී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කරනු ලබන අක්වෙරළ ව්‍යාපාර;

ඇ. විදේශ සේවාදායකයන්ට ඉදිරි මුහුණතේ සේවා (front end services) සැපයීම;

ඈ. මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම් මෙහෙයවීම මගින් ප්‍රධාන පෙලේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

ඉ. ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහුවිධ රටවල් ඒකාබද්ධ කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම

vi. අ) තනාපති විනිර්මුක්ත නීතියක් හෝ සමාන නීතියක් හෝ යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට විදේශීය රටක හෝ විදේශීය භූමි ප්‍රදේශයක රජය මඟින්;

ආ) ජාත්‍යන්තර සංවිධානයක් සහ ශ්‍රී ලංකා රජය අතර වූ ගිවිසුමක් යටතේ සලකන ලද නිදහස් කිරීම තානාපති විනිර්මුක්ති නීතියක් හෝ සමාන නීතියක් යටතේ සලකන ලද නිදහස් කිරීමට වඩා පුළුල් නම්, ඒ තානාපති විනිර්මුක්ති නීතිය හෝ සමාන නීතිය යටතේ හෝ, එම ජාත්‍යන්තර සංවිධානය සහ ශ්‍රී ලංකා රජය අතර වූ එම ජාත්‍යන්තර ගිවිසුම යටතේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රමාණයට ජාත්‍යන්තර සංවිධානයක් මඟින්;

උපයන ලද මුදල් ප්‍රමාණ

vii. යම් නිර්වාසික තැනැත්තෙකු රසායනාගාර සේවා හෝ තත්ව සහතික ලබාදීමේ සේවා සැපයීමෙන් ලබන ඕනෑම මුදල් ප්‍රමාණයක්

viii. දළ මුදල් ප්‍රමාණය රු. 500,000 නොඉක්මවන, ලොතරැයියකින් හිමි වන යම් මුදල් ප්‍රමාණයක්

**ආ. අත්තිකාරම් ආදායම් බද්ද**

ඕනෑම වාසික තැනැත්තෙකුට ගෙවනු ලබන ලාභාංශ, පොලී, වට්ටම්, ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලී, රාජ්‍යභාග, වාරික මුදලක් හෝ සමාන ගෙවීම් මත එම තැනැත්තාගේ එකඟතාවය ඇතිව අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ හැකිය. එකඟතාවය ලබා දී නොමැති නම්, එවැනි අවස්ථාවකදී අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ නොහැක.

**1. රඳවා ගැනීමේ අනුයෝජිතයා වෙත කෙරෙන ප්‍රකාශය**

රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු ගෙවීම් කරන්නෙකු වෙතින් ශ්‍රී ලංකාවේ ප්‍රභවය සහිත ඉහත සඳහන් ඕනෑම මුදල් ප්‍රමාණයක් (නිදහස් ප්‍රමාණ හැර) ලබන හෝ උපයන වාසික තැනැත්තෙකුට, අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමට ඔහුගේ එකඟතාවය සඳහන් කර අමුණා ඇති ආකෘතිය [1 (අ) සහ 1(ආ) ඇමිණුම] අනුව ප්‍රකාශයක් ගෙවීම කරන්නාට ඉදිරිපත් කළ හැකිය.

**2.** බදු අඩු කරන අනුප්‍රමාණ

අදාළ තැනැත්තතා විසින් පහත පරිදි ඔහුගේ ප්‍රකාශයෙහි දක්වා ඇති අදාළ මුදල් ප්‍රමාණ මත අදාළ ආදායම් බදු අනුප්‍රමාණ යොදා ගනිමින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතුය.

i. **ගෙවීම ලබන්නා තනි පුද්ගලයෙකු නම්**

| **මුදල් ප්‍රමාණය (රු.)** | | **බදු අනුප්‍රමාණය** |
|---|---|---|
| **වාර්ෂික අඩු කිරීම් සඳහා (ක/ව)** | **මාසික අඩු කිරීම් සඳහා** | |
| රු. 3,000,000 ක උපරිමයක් දක්වා | රු. 250,000 ක උපරිමයක් දක්වා | 6% |
| ඊළඟ මුදල් ප්‍රමාණය, එහෙත් රු. 3,000,000 ක උපරිමයක් දක්වා | ඊළඟ මුදල් ප්‍රමාණය, එහෙත් රු. 250,000 ක උපරිමයක් දක්වා | 12% |
| ඉතිරිය | ඉතිරිය | 18% |

ii. **ගෙවීම ලබන්නා වාසික පුද්ගලයෙකු හැර** වෙනත් තැනැත්තෙකු නම්,

| **අස්ථිත්වය** | **බදු අනුප්‍රමාණය** | **මුදල් ප්‍රමාණය (රු.)*** |
|---|---|---|
| හවුල් ව්‍යාපාර | 6% | |
| වාසික සමාගමකට ගෙවන ලාභාංශ | 14% | |
| පුණ්‍යායතන | 14% | |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ සමාපන අරමුදල් | 14% | |
| වාසික සමාගමක් ඇතුළුව අනෙකුත් වාසික අස්ථිත්ව | 24% | |

* (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතු මුදල් ප්‍රමාණය, ප්‍රකාශ කරන්නා විසින් අදාළ වන පරිදි සඳහන් කළ යුතුය. අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ කාර්ය සඳහා නිදහස් ප්‍රමාණ ඉවත් කිරීමට ප්‍රකාශ කරන්නාට හැකිය)

**ඇ. රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද සඳහා පොදුවේ අදාළ වන උපදෙස්**

**1. බද්ද අඩු කළ යුතු වේලාව**

රඳවා ගැනීමේ අනුයෝජිතයා/ ගෙවීම කරන්නා විසින් ගෙවීමක් කිරීමේදී අදාළ තැනැත්තාට එම මුදල අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද, බැර කරන ලද, නැවත ආයෝජනය කරන ලද, සමුච්චිත

කරන ලද, ප්‍රාග්ධනිත කරන ලද හෝ එම තැනැත්තාට ලබා ගත හැකි පරිදි තිබෙන අවස්ථාව බද්ද අඩු කළ යුතු වේලාව වේ.

## 2. අඩු කරන ලද බද්ද ගෙවීම

රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ සෑම තැනැත්තෙකු/ රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු විසින්ම අදාළ බද්ද සෑම ලිත් මාසයකම අවසානයට පසු දින පහළවක් ඇතුළත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතුය. ගෙවීම සඳහා අදාළ බදු වර්ග කේත පහත පරිදි වේ.

| | |
|---|---|
| • පොලිය මත රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද | 43 |
| • වෙනත් ගෙවීම් මත රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද | 44 |

කෙසේ වෙතත්, නිර්වාසික තැනැත්තන්ට ගෙවන ගෙවීම් මත රඳවා ගැනීමේ බද්ද, ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීම් සඳහා බැංකුවට නිශ්කාෂණ සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ නිවේදන මගින් දැන්වූ පරිදි එකතු කරනු ලැබේ.

## 3. බද්ද අඩු කිරීමේ සහතිකය

රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ සෑම තැනැත්තෙකු හෝ රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු විසින්ම අවස්ථාවෝචිත පරිදි, රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන් සහතිකයක් දක්වා ඇති ආකෘතිය අනුව සෑම තැනැත්තෙකුටම නිකුත් කළ යුතුය. රඳවා ගැනීමේ බදු හෝ අත්තිකාරම් ආදායම් බදු සහතිකය ලිත් මාසයක් සඳහා විය යුතු අතර මාසය අවසාන වී දින 30 ක් ඇතුළත ලබා දිය යුතුය.

## 4. අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ

යම් රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු වෙත ඉදිරිපත් කරන ප්‍රකාශයක් හෝ සහතිකයක්, දේශීය ආදායම් පනතේ 181 වන වගන්තියේ කාර්ය සඳහා බදු නිලධාරියෙකු වෙත ලබා දුන් ප්‍රකාශයක් ලෙස සලකනු ලබන අතර අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ මත දණ්ඩන පනවනු ලැබේ.

## 5. රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු/ ගෙවීම් කරන්නෙකු විසින් තබා ගත යුතු වාර්තා සහ ඔවුන්ගේ වගකීම්

i. රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලබන රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු දේශීය ආදායම් කෙමසාරිස් ජනරාල් යටතේ ලියාපදිංචි වූ රඳවා ගැනීමේ අනුයෝජිතයන් විය යුතුය. ඒ සඳහා ලියාපදිංචිය ලබා ගෙන නොමැති නම්, අදාළ තැනැත්තා රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම ආරම්භ කිරීමට දින 30 කට පෙර කොමසාරිස් ජනරාල් වෙතින් ලියාපදිංචි අංකයක් ලබා ගැනීම අවශ්‍ය වේ.

ii. අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ කාර්ය සඳහා, යම් රඳවා ගැනීමේ අනුයෝජිතයෙකුට වෙනම ලියාපදිංචි අංකයක් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර රඳවා ගැනීමේ අනුයෝජිතයෙකු ලෙස ලබා ගෙන ඇති ලියාපදිංචිය යටතේම එම අඩු කිරීම් සිදු කළ හැකිය.

iii. රඳවා ගැනීමේ අනුයෝජිතයන් විසින් රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම වාර්තා (ඔවුන්ට ලැබුණ ප්‍රකාශයන්ද ඇතුළත්ව) සපයා ඇති ආකෘතිය (කරුණාකර ඇමිණුම 3 බලන්න) අනුව තබා ගත යුතු අතර බදු නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවකදී භාර දිය යුතුය.

iv. රඳවා ගැනීමේ බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන්, වාර්ෂික ප්‍රකාශයට අදාළ උපලේඛන භාර දිය යුතු අතර එම උපලේඛන ඉලෙක්ට්‍රොනික ආකෘතියක (Excel csv ආකෘතියක) භාර දිය යුතුය. කෙසේ වෙතත්, රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබූ තැනැත්තන් (බදු ගෙවන්නන්) සංඛ්‍යාව 20 ට වඩා අඩු වේ නම්, දෘඩ පිටපත් භාර දිය හැකිය.

**ඒ. නඳුන් ගුරුගේ**
**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

ඇමිණුම **1** (අ)

## **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**

…………………………………………….. **වෙත**
……………...…………………………...
……………………………………………...
(ගෙවීම කරන්නා/ රඳවා ගැනීමේ අනුයෝජිතයා ගේ නම සහ ලිපිනය)

**ගෙවීමේ ස්වභාවය:** පොලී/ ලාභාංශ/ ගාස්තු/ කුලී/ රාජ්‍යභාග/ ස්වභාවික සම්පත් ගෙවීමක්/ වෙනත් යම් periodic ගෙවීමක් (කරුණාකර ගෙවීම් වර්ගය සඳහන් කරන්න)

තක්සේරු වර්ෂය: …………………………………

## **වාසික පුද්ගලයන් විසින් කරනු ලබන ප්‍රකාශය**

……………………………………………………………………………………………..
…………………………………………………………………………...……... (ලිපිනය) හි
පදිංචි ..........................................................................................................................
……………………………………………………………………….... (සම්පූර්ණ නම) **වන මම,**

ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකු (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) වන බව සහ ඉහත තක්සේරු වර්ෂය සඳහා මා විසින් උපයන ලද තක්සේරු කළ හැකි ආදායම (වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම්ද ඇතුළත්ව) රු. 3,0000,000 ඉක්මවිය හැකි බවත් මෙයින් ප්‍රකාශ කරමි.

එබැවින්, තක්සේරු වර්ෂය සඳහා අදාළ ඉහත සඳහන් ගෙවීම් වලින්, කරුණාකර පහත පරිදි අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන්න.

| **තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත තක්සේරු කළ හැකි ආදායම (රු.)** | **අනුප්‍රමාණය** | **අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණය (රු.)** |
|---|---|---|
| 3,000,000 – 6,000,000 | 6% | * |
| 6,000,001 – 9,000,000 | 12% | * |
| 9,000,001 සහ ඊට වැඩි | 18% | |

*උපරිම මුදල් ප්‍රමාණය රු. 3,000,000 විය යුතුය

ජාතික හැඳුනුම්පත් අංකය ............................................

බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය ..........................................

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

මාගේ වාසිකත්වයෙහි සිදුවන යම් වෙනසක්, එම වෙනස සිදුවන අවස්ථාවේදී දැනුම් දෙමි.

......................................  ........................................................

දිනය  ප්‍රකාශ කරන්නාගේ අත්සන

ඇමිණුම **1** **(**ආ**)**

**දේශිය ආදායම් දෙපාර්තමේන්තුව**

………………………………………….. **වෙත**
……………..………………………………...
……………………………………………...
(ගෙවීම කරන්නා/ රඳවා ගැනීමේ අනුයෝජිතයා ගේ නම සහ ලිපිනය)

**ගෙවීමේ ස්වභාවය:** පොලී/ ලාභාංශ/ ගාස්තු/ කුලී/ රාජ්‍යභාග/ ස්වභාවික සම්පත් ගෙවීමක්/ වෙනත් යම් periodic ගෙවීමක් (කරුණාකර ගෙවීම් වර්ගය සඳහන් කරන්න)

**වාසික අස්ථිත්ව විසින් කරනු ලබන ප්‍රකාශය**

…………………………………………………………………………………………………
............................................................................. (අස්ථිත්වයේ ලිපිනය) ලියාපදිංචි කාර්යාලය පිහිටි ..............................................................................................................................
.................................................................................................................... (අස්ථිත්වයේ නම)
............................................................................................................................ (තනතුර) වන
...................................................................................................................................
...................................................................................................................................
(ප්‍රකාශ කරන්නාගේ සම්පූර්ණ නම**;** අස්ථිත්වයේ කළමනාකරු, අධ්‍යක්ෂ, ලේකම් හෝ බලය ලත් නිලධාරියා) වන මම, මෙම අස්ථිත්වය ශ්‍රී ලංකාවේ වාසික අස්ථිත්වයක් (2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන පරිදි) වන බව සහ ඉහත තක්සේරු වර්ෂය සඳහා මෙම අස්ථිත්වය සඳහා තක්සේරු කළ හැකි ආදායමක් තිබිය හැකි බව මෙයින් ප්‍රකාශ කරමි.

එබැවින්, තක්සේරු වර්ෂය සඳහා කරුණාකර පහත පරිදි අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරන්න.

| **අස්ථිත්වය** | **බදු අනුප්‍රමාණය** | **මුදල් ප්‍රමාණය (රු.)*** |
|---|---|---|
| හවුල් ව්‍යාපාර | 6% | |
| වාසික සමාගමකට ගෙවන ලාභාංශ | 14% | |
| පුන්‍යායතන | 14% | |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් අරමුදල් හෝ සමාපන අරමුදල් | 14% | |
| වාසික සමාගමක් ඇතුළුව අනෙකුත් වාසික අස්ථිත්ව | 24% | |

* (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතු මුදල් ප්‍රමාණය ප්‍රකාශ කරන්නා විසින් අදාළ වන පරිදි සඳහන් කළ යුතුය. අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ කාර්ය සඳහා නිදහස් මුදල් ප්‍රමාණ ඉවත් කිරීමට ප්‍රකාශ කරන්නාට හැකිය.)

බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය ..........................................

මා විසින් ඉහත කරන ලද ප්‍රකාශය සත්‍ය සහ නිවැරදි බව ප්‍රකාශ කරමි.

..................................... ........................................................

දිනය ප්‍රකාශ කරන්නාගේ අත්සන

ඇමිණුම 2(අ)

සහතික අංකය:/ අනු අංකය: …………………………………………...

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය: ……………………………………

## අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීමේ සහතිකය

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ නම සහ ලිපිනය:
……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

ලබන්නාගේ නම සහ ලිපිනය:
…………………………………………………………………………………………………………
………………………………………………………………………………………………

ප්‍රකාශයේ යොමු අංකය: ………………………………………………

ජාතික හැඳුනුම් පත් අංකය/ ගමන් බලපත්‍ර අංකය/ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය ……………………………

කාල සීමාව: සිට …………………… දක්වා …………………………………

දළ ගෙවීම් ප්‍රමාණය (රු.) ……………………………………..

| තැනැත්තා | අදාළ වන අනුප්‍රමාණය | අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන මුදල් ප්‍රමාණය (රු.) | අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද (රු.) |
|---|---|---|---|
| වාසික පුද්ගලයන් | 6% | | |
| | 12% | | |
| | 18% | | |
| වාසික අස්ථිත්ව | 6% | | |
| | 14% | | |
| | 24% | | |
| වෙනත් | | | |
| එකතුව | | | |

බලය ලත් නිලධාරියාගේ නම සහ අත්සන ..............................................................................................

…………………......

දිනය

සහතික අංකය/ අනු අංකය: …………………………………………...

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය: ………………………………….

**රඳවා ගැනීමේ බදු අඩු කිරීමේ සහතිකය**

රඳවා ගැනීමේ අනුයෝජිතයාගේ නම සහ ලිපිනය:

………………………………………………………………………………………………………

………………………………………………………………………………………………………

ලබන්නාගේ නම සහ ලිපිනය:

………………………………………………………………………………………………………

……………………………………………………………………………………………..............

ජාතික හැඳුනුම් පත් අංකය/ ගමන් බලපත්‍ර අංකය/ බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය .......................................

කාල සීමාව: සිට ……………………  දක්වා …………………………………

දළ ගෙවීම් ප්‍රමාණය (රු.) ……………………………………..

| **තැනැත්තා** | **රඳවා ගැනීමේ බදු අනුප්‍රමාණය %** | **රඳවා ගැනීමේ බද්දට යටත් වන මුදල් ප්‍රමාණය (රු.)** | **අඩු කරන ලද රඳවා ගැනීමේ බදු ප්‍රමාණය (රු.)** |
|---|---|---|---|
| වාසික පුද්ගලයන් | | | |
| නිර්වාසික එහෙත් පුරවැසියන් වන පුද්ගලයන් | | | |
| නිර්වාසික පුරවැසියන් නොවන පුද්ගලයන් | | | |
| වාසික අස්ථිත්වය | | | |
| නිර්වාසික අස්ථිත්වය | | | |

බලය ලත් නිලධාරියාගේ නම සහ අත්සන ……………………………………………………………………………………

…………………......

දිනය

ඇමිණුම **3**

නිර්වාසික තැනැත්තන්ට කරන ලද, රඳවා ගැනීමේ බද්දට යටත් නොවන ගෙවීම් ද (ස්පර්ශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා කරන ලද ගෙවීම් හැර) ඇතුළුව රඳවා ගැනීමේ බදු අඩු කිරීම සම්බන්ධයෙන් පහත උපලේඛන සකස් කළ යුතුය.

| අනු අංකය | ගෙවීම වර්ගය | ලබන්නාගේ නම | ලබන්නාගේ ලිපිනය | ලබන්නාගේ වාසික රට | ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුද නැත්ද යන බව | ගෙවීම කාල සීමාව | ගෙවූ දළ මුදල් ප්‍රමාණය (එකතු කළ අගය මත බද්ද හැර) | බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගමන් බලපත්‍ර අංකය ඇත්නම් | බදු නිශ්චායක සහතිකයේ යොමු අංකය | බදු අඩු කිරීම සඳහා සලකනු ලැබූ මුදල් ප්‍රමාණය | බදු අනුපාතය | අඩු කරන ලද බදු ප්‍රමාණය | බදු අඩු කිරීමේ සහතිකයේ යොමුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම සම්බන්ධයෙන් පහත උපලේඛනය සකස් කළ යුතුය.

| අනු අංකය | නම | ලිපිනය | බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගමන් බලපත්‍ර අංකය | ගෙවීම වර්ගය | ගෙවීම කාල සීමාව | ගෙවූ දළ මුදල් ප්‍රමාණය | ප්‍රකාශයේ යොමුව | බදු අඩු කිරීම සඳහා සලකනු ලැබූ මුදල් ප්‍රමාණය | බදු අනුපාතය | අඩු කරන ලද බදු ප්‍රමාණය | බදු අඩු කිරීමේ සහතිකයේ යොමුව (නිකුත් කර ඇත්නම්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |